# මැණික් පතල් හා ග්‍රාමීය දරිද්‍රතාව : පතල් කම්කරුවන්ගේ සමාජ-ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනයක්

*එරන්දි මහේෂිකා [1] සහ කරුණාරත්න, එම්. එස්. එම්. එල්. [2]*

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත අතුරින් මැණික් කර්මාන්තය සුවිශේෂී වේ. කාලය හා අවකාශය සම්බන්ධයෙන් කිසියම් ගතිකත්වයක් පැවතියත් ප්‍රාදේශීය ප්‍රජාවගේ ජීවන ව්‍යවහාරයන් සමග එය ඍජුව හා වක්‍රව බද්ධ වී පවතී. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පතල් කම්කරුවන්ගේ සමාජ-ආර්ථික පැතිකඩ හඳුනා ගැනීම හා පතල් කර්මාන්තයේ නියුක්තිය සහ යථෝක්ත සාධක අතර ඇති සබඳතාව විමර්ශනය කිරීමයි. රත්නපුර දිස්ත්‍රික්කයේ ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය වශයෙන් යොදා ගැනුණු අතර ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි සමීක්ෂණය, ඍජු නිරීක්ෂණය, ඉලක්කගත සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයන යොදාගනු ලැබිණි. මෙම පර්යේෂණයෙන් අනාවරණය කරගත් ප්‍රතිඵල අනුව පතල් කම්කරුවන්ගෙන් 90%කට වැඩි පිරිසක් දරිද්‍රතා මට්ටමෙන් පහළ ජීවත් වන අය වූ අතර, ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම හා පතල් කර්මාන්තයේ නියුක්තිය අතර ඍජු සබඳතාවක් හඳුනාගත හැකි විය. බැංකු හා රක්ෂණ ක්‍රම සමග බද්ධ වීමේ අවකාශ පහළ මට්ටමක පැවතීම, වෙනත් ආයෝජන අවස්ථා හිඟ වීම, ආබාධිත වීම්, සෞඛ්‍ය ගැටලු හා මත්ද්‍රව්‍ය භාවිතය ආදි සමාජ-ආර්ථික ගැටලු ගණනාවකට මෙම වෘත්තිකයන් මුහුණ පා සිටින බව පර්යේෂණ දත්ත ඇසුරින් අනාවරණය කරගත හැකි විය. පතල් කම්කරුවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට පතල් කර්මාන්තයේ දායකත්වය ප්‍රමාණවත් නොවන බවත්, ඔවුන් දරිද්‍රතාව තුළ රඳවා තබා ගැනීමට පතල් කර්මාන්තය අනියම් ආකාරයෙන් හේතු වී ඇති බවත් මෙම පර්යේෂණය ඇසුරින් හඳුනා ගැනිණ.

**ප්‍රමුඛ පදඃ** මැණික් පතල්, සමාජ ආර්ථික පසුබිම, දරිද්‍රතාව, ඕපනායක පතල් කම්කරුවෝ

[1] *භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*erandimaheshika1990@gmail.com*
[2] *භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*